ආයතන අධ්‍යක්‍ෂගේ අංකය: V1/814/ඒ/302/10
මගේ අංකය: ආර්එච්බී/2/4/61.

## රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සංචාරක නිවාස සඳහා බංගලා භාරකරුවන් බඳවා ගැනීමේ පරිපාටිය.

| | |
|---|---|
| 01. තනතුර | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පාලනය වන සංචාරක නිවාස වල බංගලා භාරකරු. |
| 02. (1) තනතුර අයත් අමාත්‍යාංශය: | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය. |
| (11) බඳවාගැනීමේ අමාත්‍යාංශය: | -එම - |
| 03. තනතුරේ සාමාන්‍ය රාජකාරි: | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පාලනය වන සංචාරක නිවාසය හා භූමිය පිරිසිදුව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාම, පැමිණෙන සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සැපයීම හා ඉල්ලා සිටින්නේ නම් ඔවුන්ට ආහාරපාන පිළියෙල කරදීම සහ සංචාරක නිවාසයට සම්බන්ධ අදාල වෙනත් රාජකාරි. |
| 04. වයස් සීමාව: | අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින්නන් කෙරෙහි ඉහළ වයස් සීමාව බලපානු නොලැබේ. |
| 05. වැටුප් පරිමාණය: | රු:40800-20X960-60000/- වාර්ෂික වැටුප (රු:42720/- ට එළඹීමට පෙර වාචික පරීක්‍ෂණයකින් යුතු කාර්යක්‍ෂම කඩඉමකි.) |
| 06. කාර්යක්‍ෂමතා කඩඉම: | වාර්ෂික වැටුප රු:42720/- වැටුප් පියවරට එළඹීමට පෙර වාචික |

.....2

පරීක්ෂණයකින් යුත් කාර්යක්ෂමතා කඩඉමකි.
(වයස අවුරුදු 45 සම්පූර්ණ වීම මත මෙම කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු ලැබේ.)

<u>කාර්යක්ෂමතා කඩඉම් විභාග විෂය නිර්දේශය.</u>

වෘත්තිය පිළිබඳ පහත සඳහන් කරුණු ආශ්‍රිත මිනිත්තු 15 ක වාචික පරීක්ෂණයක් පැවැත්වේ.

(1) සංචාරක නිවාස ක්‍රමවත්ව පවත්වාගෙන යාම හා උද්‍යානය අලංකාරව පවත්වාගෙන යාම පිළිබඳ කටයුතු.

(2) සංචාරක බංගලාවේ විදුලි බිල්පත්, ජල බිල්පත්, දුරකථන බිල්පත් නිරවුල් කිරීම පිළිබඳ කටයුතු.

(3) බංගලා භාරකරු තනතුරට අදාලවන අයුරින් ආයතන සංග්‍රහය/මුදල් රෙගුලාසි හා විනය කටයුතු පිළිබඳ සාමාන්‍ය දැනුමක් ලබා තිබිය යුතුය.

07. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්:

(අ) අටවන ශ්‍රේණිය සමත්ව තිබීම

හා

(ආ) ලංකා හෝටල් පාසලේ පුහුණුව සාර්ථක ලෙස නිමකර සහතික ලැබූ අයෙකු වීම

හෝ

රජයේ සංචාරක බංගලා/තානායම් කටයුතු පිළිබඳ අවුරුදු 05 කට නොඅඩු පළපුරුද්දක් ඇති අයෙකු වීම.

08. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය:

(අ) (1) රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සංචාරක බංගලාවන්හි සේවයේ නියුතු අවුරුදු දෙකකට නොඅඩු අඛන්ඩ සතුටුදායක සේවාවක් හා නියමිත අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති තාවකාලික හෝ අනියම් සේවකයින් අතරින් ඉල්ලුම් පත් කැඳවීමෙන්.

....3

(11) ඉහත (1) යටතේ සුදුසු ඉල්ලුම්කරුවන් නොමැති විට ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් ඉල්ලුම් පත් කැඳවීමෙන් පසු සුදුසුකම් ඇති අයදුම්කරුවන් පුරප්පාඩු පවත්නා දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් විසින් 1995.07.19 දිනැති අංක 24/95 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් වාචික පරීක්ෂණයට භාජනය කිරීමෙන් පත්වීම් දීමට සුදුසුකම් මත තෝරා ගනු ලැබේ.

(ආ) ලකුණු දීමේ ක්‍රමය

(1) ලිවීම, කියවීමේ හැකියාව පරීක්ෂා කිරීම මැන බැලීම. ලකුණු 20

(2) සංචාරක නිවාස පවත්වා ගෙන යාම පිළිබඳ පළපුරුද්ද උපරිම ලකුණු 40

(3) අදාල වෘත්තීය පිළිබඳ ලබා ඇති පුහුණු සහතික ලකුණු 40

(11). සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුවේ. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ. (දැනට රජයේ ස්ථිර තනතුරක් දරන්නෙකු තෝරා පත්කර ගනු ලැබුවහොත් ඔහු හෝ ඇය අවුරුදු එකක පරීක්ෂණ කාලයකට යටත්ව පත් කරනු ඇත.)

10. සේවා කොන්දේසි:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 1 කොටස (2අ) වෙනි ඡේදයේ පළකරනු ලබන රාජ්‍ය සේවා පත්කිරීම් වලට අදාලවන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 වන පරිච්ඡේදයේ විධිවිධාන හා මුදල් රෙගුලාසි වලට ද රජය විසින් වරින් වර පනවනු ලබන වෙනත් කොන්දේසි වලටද යටත්විය යුතුය.

ඒ. ඩබ්. කරුණාරත්න
අතිරේක සහකාර ලේකම් (ප්‍රාදේශීය පාලන)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.
නිදහස් චතුරශ්‍රය
කොළඹ - 07.

දිනය: 99/10/22

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.